## විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය
## නවීන තාක්ෂණය පිළිබඳ
## ආතර් සී. ක්ලාක් ආයතනය (ACCIMT)

# ඇබෑර්තු

## අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරී තනතුර

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වන නවීන තාක්ෂණය පිළිබඳ ආතර් . සී. ක්ලාක් ආයතනය (ACCIMT), පර්යේෂණ හා සංවර්ධන, පුහුණු කිරීම් සහ තාක්ෂණ හුවමාරුව මගින් ඉලෙක්ට්‍රොනික විද්‍යාව, සන්නිවේදනය, තොරතුරු තාක්ෂණය, රොබෝ තාක්ෂණය සහ අභ්‍යවකාශ තාක්ෂණය යන ක්ෂේත්‍රයන්හි නවීන තාක්ෂණයන් හඳුන්වා දීම වේගවත් කිරීමේ වගකීම පැවරුණු ආයතනයකි.

පහත දැක්වෙන තනතුර සඳහා යෝග්‍ය ලෙස සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් ආයතනය අයදුම්පත් කැඳවනු ලැබේ.

සේවක කාණ්ඩය : ජ්‍යෙෂ්ඨ කළමනාකරු

මෙම කාණ්ඩයේ සේවකයා වෙත පැවරී ඇති කාර්යයන්හි ස්වභාවය පිළිබඳ මණ්ඩලීය නිර්වචනය :

අධ්‍යක්ෂ ජනරාල්වරයා (ප්‍රධාන විධායක නිලධාරී) යනු ආයතනයේ ඉහළම මට්ටමේ විධායක නිලධාරියා වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ පොදු මඟපෙන්වීම සහ පාලනය යටතේ, මණ්ඩලය විසින් පවරනු ලබන බලතල, කාර්යයන් සහ රාජකාරි ඉටු කරමින්, ආයතනයේ සියලුම ක්‍රියාකාරකම්, පරිපාලන සහ මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා වගකිව යුතු වේ. එමෙන්ම තිල ජයග්‍රහණ, තාක්ෂණික උත්පාදනය සහ තාක්ෂණ හුවමාරුවෙහි විශිෂ්ටත්වය ළඟා කර ගැනීම සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලයට නායකත්වය සහ දිරිගැන්වීම් සැපයිය යුතුය.

**තනතුරට ඇතුළත් ප්‍රධාන රාජකාරි**

- ආයතනයේ සමස්ත පරිපාලන සහ මූල්‍ය පාලනය.
- ආදායම වැඩි කිරීමේ අරමුණින් නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා සැලසුම් සකස් කිරීම සහ ක්‍රියාකාරකම් මෙහෙයවීම.
- ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට උපදෙස් දීම.
- අදාළ ආයතන අතර සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- අනෙකුත් අදාළ ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට සහභාගී වීම.
- ජාත්‍යන්තර කරුණු හා සම්බන්ධ කටයුතු සිදු කිරීම.
- දේශීය හා ජාත්‍යන්තර සමුළු, සම්මන්ත්‍රණ, වැඩමුළු ආදියට සහභාගී වීම.
- වාර්තා සහ ප්‍රකාශන ඉදිරිපත් කිරීම.
- පාලක සභාව විසින් පවරනු ලබන වෙනත් ඕනෑම රාජකාරියක්.

**පත්වීමේ ස්වභාවය :**

1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනතේ 27(2) සහ 27(4) වගන්තිවලට අනුව වසර පහක කාලසීමාවක් සඳහා වලංගු වන ස්ථිර පත්වීමක් වන අතර, සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවක භාරකාර අරමුදල (ETF) සඳහා හිමිකම් පවතී.

**වැටුප් කේතය සහ මාසික වැටුප් පරිමාණය**

(2027.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය කළමනාකරණ සේවා (DMS) චක්‍රලේඛ අංක 01/2025 සම්පූර්ණයෙන්ම අදාළ වේ)

HM 2 - 3 - 2025 - රු. (173,000 - 12 x 4850 - 231,200)

**මූලික වැටුප** : රු. 150,325/- + අතිරේකව රු. 17,800/-
(ජීවන අංක දීමනාව + රජයේ චක්‍රලේඛ මගින් වෙන්කර ඇති වෙනත් ඕනෑම අදාළ දීමනාවක්)

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන්: (පහත 1 හෝ 2)**

01. (අ) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) ආශ්‍රිත සාමාජිකත්වය ලබා ගැනීම සඳහා පිළිගත්, ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලයකින් අදාළ ඉංජිනේරු විෂය පථයකින් (ඉලෙක්ට්‍රොනික/විදුලි සන්නිවේදන හෝ අදාළ ක්ෂේත්‍රයකින්) ඉංජිනේරු විද්‍යාවේදී (BSc Eng) වසර හතරක පූර්ණ කාලීන ප්‍රථම උපාධියක් ලබා තිබීම

හෝ

(ආ) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන, නියමිත ඉංජිනේරු විෂය පථයට අදාළ විභාගයේ සියලුම කොටස් සම්පූර්ණ කර සමත්වී, එමගින් ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය සඳහා සුදුසුකම් ලබා තිබීම

හෝ

(ඇ) එක්සත් රාජධානියේ ඉංජිනේරු කවුන්සිලය (Engineering Council of the United Kingdom) මගින් වරලත් ඉංජිනේරු (Chartered Status) තත්ත්වය ලබා ගැනීම සඳහා නිර්දේශිත අධ්‍යයන සුදුසුකම් සපුරාලන, එම කවුන්සිලය හෝ ඒ අනුබද්ධ ආයතනයක් මගින් අදාළ ඉංජිනේරු විෂය පථය යටතේ පවත්වනු ලබන විභාගයේ සියලුම කොටස් සම්පූර්ණ කර සමත් වී තිබීම

හෝ

(ඈ) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය සඳහා සුදුසුකම් ලබන පරිදි, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් වෙනත් ඕනෑම විශ්වවිද්‍යාලයකින් හෝ ආයතනයකින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යාවේදී උපාධියකට සමාන ඉංජිනේරු උපාධියක් ලබා තිබීම

හෝ

(ඉ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ආයතනයකින් අදාළ විෂය පථයකින් (භෞතික විද්‍යාව/ තාරකා විද්‍යාව/ අභ්‍යවකාශ විද්‍යාව/ භූමිතික විද්‍යාව (Geomatics) / ගණිතය හෝ අදාළ ක්ෂේත්‍රයකින්) වසර හතරක පූර්ණ කාලීන විද්‍යාවේදී (BSc) උපාධියක් ලබා තිබීම.

සහ

පිළිගත් විශ්වවිද්‍යාලයකින් අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධියක් (PhD) ලබා තිබීම හෝ වරලත් ඉංජිනේරුවරයෙකු (Chartered Engineer) ලෙස වෘත්තීය ලියාපදිංචිය සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ අධි සාමාජිකයෙකු (CEng., FIESL) වී තිබීම.

සහ

රාජ්‍ය දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ ආයතනයක ඉංජිනේරුවරයෙකු / විද්‍යාඥයෙකු ලෙස හෝ ඊට සමාන තත්ත්වයක අවම වශයෙන් වසර 20 ක සේවා පළපුරුද්දක් තිබිය යුතු අතර, ඉන් වසර 05 කට නොඅඩු කාලයක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තිබිය යුතුය. එමෙන්ම බහු විෂයයික කණ්ඩායම් මෙහෙයවීමට සහ කළමනාකරණය කිරීමට මෙන්ම මානව හා වෙනත් සම්පත් නිසි ලෙස යෙදවීමට සහ කාර්යක්ෂමව කළමනාකරණය කිරීමට ඇති හැකියාව සනාථ කර තිබිය යුතුය.

02. (අ) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ලබා ගැනීම සඳහා පිළිගත්, ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලයකින් අදාළ ඉංජිනේරු විෂය පථයකින් (ඉලෙක්ට්‍රොනික / විදුලි සන්නිවේදන හෝ අදාළ ක්ෂේත්‍රයකින්) ඉංජිනේරු විද්‍යාවේදී (BSc Eng) වසර හතරක පූර්ණ කාලීන ප්‍රථම උපාධියක් ලබා තිබීම

හෝ

(ආ) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන, නියමිත ඉංජිනේරු විෂය පථයට අදාළ විභාගයේ සියලුම කොටස් සම්පූර්ණ කර සමත්වී, එමගින් ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය සඳහා සුදුසුකම් ලබා තිබීම

හෝ

(ඇ) එක්සත් රාජධානියේ ඉංජිනේරු කවුන්සිලය (Engineering Council of the United Kingdom) මගින් වරලත් ඉංජිනේරු (Chartered Status) තත්ත්වය ලබා ගැනීම සඳහා නිර්දේශිත අධ්‍යයන සුදුසුකම් සපුරාලන, එම කවුන්සිලය හෝ ඒ අනුබද්ධ ආයතනයක් මගින් අදාළ ඉංජිනේරු විෂය පථය යටතේ පවත්වනු ලබන විභාගයේ සියලුම කොටස් සම්පූර්ණ කර සමත් වී තිබීම

හෝ

(ඈ) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය සඳහා සුදුසුකම් ලබන පරිදි, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් වෙනත් ඕනෑම විශ්වවිද්‍යාලයකින් හෝ ආයතනයකින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යාවේදී උපාධියකට සමාන ඉංජිනේරු උපාධියක් ලබා තිබීම.

සහ

වරලත් ඉංජිනේරුවරයෙකු ලෙස වෘත්තීය ලියාපදිංචිය සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ආයතනික සාමාජිකයෙකු (CEng., MIESL) වී තිබීම හෝ එක්සත් රාජධානියේ (UK) ඉංජිනේරු කවුන්සිලයේ වරලත් ඉංජිනේරුවරයෙකු ලෙස වෘත්තීය ලියාපදිංචිය සහ එක්සත් රාජධානියේ අදාළ විෂය පථයට අයත් වෘත්තීය ඉංජිනේරු ආයතනයක, ආයතනික සාමාජිකයෙකු වී තිබීම.

සහ

රාජ්‍ය දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ ආයතනයක ඉංජිනේරුවරයෙකු ලෙස හෝ ඊට සමාන තත්ත්වයක අවම වශයෙන් වසර 20 ක සේවා පළපුරුද්දක් තිබිය යුතු අතර, ඉන් වසර 10 කට නොඅඩු කාලයක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තිබිය යුතුය. එමෙන්ම බහු විෂයයික කණ්ඩායම් මෙහෙයවීමට සහ කළමනාකරණය කිරීමට මෙන්ම මානව හා වෙනත් සම්පත් නිසි ලෙස යෙදවීමට සහ කාර්යක්ෂමව කළමනාකරණය කිරීමට ඇති හැකියාව සනාථ කර තිබිය යුතුය.

**සටහන :** ව්‍යාපාර පරිපාලනවේදී පශ්චාත් උපාධියක් සහිත අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :**

නවීන තාක්ෂණය පිළිබඳ ආතර් . සී. ක්ලාක් ආයතනයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරු (HM 2-2) ශ්‍රේණියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණික මෙහෙයුම් / සැලසුම් සහ සංවර්ධන / අභ්‍යවකාශ තාක්ෂණ සහ යෙදවුම්) තනතුරක අවම වශයෙන් වසර 5 ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

සහ

බහු විෂයයික කණ්ඩායම් මෙහෙයවීමට සහ කළමනාකරණය කිරීමට ඇති හැකියාව සනාථ කර තිබීම. මානව හා වෙනත් සම්පත් නිසි ලෙස යෙදවීම සහ කාර්යක්ෂමව කළමනාකරණය කිරීම පිළිබඳ පළපුරුද්ද.

**සටහන :** ව්‍යාපාර පරිපාලනවේදී පශ්චාත් උපාධියක් සහිත අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

**වයස :** අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. උපරිම වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

**වෙනත් සුදුසුකම්**

**සෑම අයදුම්කරුවෙකුම,**

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
II. තනතුරේ රාජකාරි මැනවින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
III. විශිෂ්ට චරිත ස්වභාවයකින් යුක්ත විය යුතුය.

**වෙනත් ප්‍රතිලාභ**

අ) සේවක අර්ථසාධක අරමුදල (EPF) – සේවකයා 10%, ආතර් සී. ක්ලාක් ආයතනය (ACCIMT) 15%.
ආ) සේවක භාරකාර අරමුදල (ETF) – ආතර් සී. ක්ලාක් ආයතනය (ACCIMT) 3%.
ඇ) අදාළ වෘත්තීය ආයතනවල සාමාජික ගාස්තු ප්‍රතිපූරණය කිරීම.
ඈ) නිශ්චිත සීමාවන් තුළ නේවාසික සහ බාහිර ප්‍රතිකාර ආවරණය වන වෛද්‍ය යෝජනා ක්‍රමයක්.
ඉ) අදාළ රජයේ චක්‍ර ලේඛයන්ට යටත්ව ඉන්ධන දීමනාව සහිත නිලරථ පහසුකමක් හෝ ඉන්ධන දීමනාව සහිත ප්‍රවාහන දීමනාවක් ලබාදෙනු ලැබේ..

**අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය :** 2026.09.28

**අයදුම් කිරීමේ ක්‍රමය**

රාජ්‍ය දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතනවල නිලධාරීන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.

සහතික පත්‍රවල ඡායා පිටපත් සහ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සහිත සම්පූර්ණ ජීව දත්ත තොරතුරු ඇතුළත් අයදුම්පත්, කවරයේ ඉහළ වම් කෙළවරේ "**අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරී තනතුර**" ලෙස සඳහන් කර, ලියාපදිංචි තැපැලෙන් පහත සඳහන් ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය.

**ලේකම්,**
**විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය,**
**3 වන මහල, 1 වන අදියර,**
**"සෙත්සිරිපාය", බත්තරමුල්ල.**

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED